# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

FMM SRI LANKA නිදහස් මාධ්‍ය ව්‍යාපාරය சுதந்திர ஊடக இயக்கம் Free Media Movement

2023 මැයි
3 වන වෙළුම - කලාප අංක 05


පා ගමනක් ගිය නූර් අත්අඩංගුවට


ප්‍රියත් නිකේෂලට ප්‍රහාරයක්


ප්‍රහසන ශිල්පිනී නතාෂා රිමාන්ඩ්

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/සංරචකයන්ට අදාළ සිදුවීම් 23ක් 2023 මැයි මාසයේදී නිරීක්ෂණය විය. ආරක්ෂාව හා සුරක්ෂිතබව යන සංරචකයට අයත් සිදුවීම් 03ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 11ක්, වෘත්තියවේදිත්වයට අදාළ එක් සිදුවීමක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ සිදුවීම් 08ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. රජය විසින් කෙටුම්පත් කර ඇති නව ත්‍රස්ත විරෝධී පනත පිළිබඳව එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවන් 10 දෙනෙකු ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට ලිපියක් යොමු කිරීම.
2. දේශපාලන මතයක් දැරීම නිසා අසාදු ලේඛනගත කිරීමට එරෙහිව විශ්‍රාමික හමුදා නිලධාරියකු මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.
3. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා යෝජිත ත්‍රස්ත විරෝධී පනතෙන් (ATA) භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ඇති කරන බලපෑම පිළිබඳ සම්මන්ත්‍රණයක් කොළඹදී පැවැත්වීම.
4. ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය නිමිත්තෙන් 'ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් හා සිවිවන කුලුනේ භූමිකාව' මැයෙන් මාර්ගගත සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
5. මාධ්‍ය මර්දනයට හා යෝජිත ත්‍රස්ත විරෝධී පනතට විරෝධය පළ කරමින් උතුරේ ජනමාධ්‍යවේදීන් මාධ්‍ය නිදහස් දිනය සැමරීම.
6. මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන්ට එරෙහි නඩුව:

පැමිණිලිකාර හමුදා බුද්ධි අංශ නිලධාරියාට නොතීසි නිකුත් කිරීම.

7. පොලිසියට තොරතුරක් ලබා දුන් පුද්ගලයකු ICCPR පනත යටතේ සැකකරුවකු කිරීම, අධිකරණයේ දෝෂදර්ශනයට ලක් වීම.

8. ගෝල්ෆේස් අරගලකරුවන්ට පහරදීමේ සිද්ධියට වසරක් පිරීම සැමරීමට ගිය සිවිල් ක්‍රියාකාරිකයින් පිරිසක් පොලිසිය විසින් පලවා හරිනු ලැබීම.

9. ගෝල්ෆේස් ප්‍රහාරය සම්බන්ධයෙන් යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා තනිව පාගමනක නිරත වූ සමාජ ක්‍රියාකාරිනියක අත්අඩංගුවට ගැනීම.

10. සමාජ මාධ්‍ය ක්‍රියාකාරික දර්ශන හඳුන්ගොඩට එරෙහිව අධිකරණයෙන් පනවා තිබූ වාරණ නියෝගයක් දීර්ඝ කිරීම.

11. සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන ප්‍රියත් නිකේෂලට දේශපාලනඥයකු ඇතුළු කණ්ඩායමක් පහර දීම.

12. රජය මගින් කෙටුම්පත් කර ඇති ත්‍රස්ත විරෝධී පනත මගින් ජනමාධ්‍ය නිදහසට හා ජනමාධ්‍යවේදීන්ට එල්ල වන බලපෑම පිළිබඳ සංවාදයක් හෑෂ්ටැග් පරපුර විසින් පැවැත්වීම.

13. වීසා අවලංගු කිරීමෙන් මූලික අයිතිවාසිකම් කඩ වූ බවට බ්‍රිතාන්‍ය ජාතික තරුණියක ඉදිරිපත් කළ පෙත්සම ප්‍රතික්ෂේප කිරීම.

14. උතුරේ බෞද්ධ විහාරස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව උද්ඝෝෂණයක නිරත වූ 9 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.

15. තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් කොළඹදී එළිදැක්වීම.

16. ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා වසා දැමීමට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව තීරණය කිරීම.

17. ගුවන්විදුලි සංස්ථාවේ සේවකයින් සඳහා, ස්වේච්ඡාවෙන් සේවයෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දීම.

18. ප්‍රහසනාත්මක ඉදිරිපත්කිරීමකදී ආගමික අපහාසයක් සිදු කළේය යන චෝදනාව මත, ප්‍රහසන කලා ශිල්පිනී නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීම.

19. නතාෂා එදිරිසූරියගේ ප්‍රහසනාත්මක ඉදිරිපත් කිරීම, යූ ටියුබ් ඔස්සේ ප්‍රචාරය කිරීමේ චෝදනාව මත යූටියුබ් නාලිකා ප්‍රධානියකු අත්අඩංගුවට ගැනීම.

20. වෛද්‍ය චමල් සංජීවගේ මූලික අයිතිවාසිකම් පෙත්සම, ශ්‍රේෂ්ඨාධිකරණය නිශ්ප්‍රභ කිරීම.

21. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් නඩු දෙකකට අදාළව සැකකරුවකු ලෙස නම් කිරීම වළක්වන ලෙස ඉල්ලා ගොනු කර ඇති අභියාචනයේ තීන්දුවට දින නියම කිරීම.

22. ප්‍රහසන කලා ශිල්පිනී නතාෂා එදිරිසූරියට එරෙහිව ICCPR පනත යටතේ චෝදනා ගොනු කිරීමට විරෝධය පළ කරමින් කලා ක්ෂේත්‍රයේ පිරිසක් ප්‍රවෘත්ති සාකච්ඡාවක් පැවැත්වීම.

23. අරුණ පුවත්පතේ මාධ්‍යවේදියකු පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව හමුවට කැඳවන්නැයි, ඇමති කංචන විජේසේකර කථානායකවරයාගෙන් ඉල්ලා සිටීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2023 මැයි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 03 |
| නීතිමය කොන්දේසි | 11 |
| වෘත්තියවේදීත්වය | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 08 |
| **එකතුව** | **23** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා රැසක් මැයි මාසයේදී නිරීක්ෂණය විය. එයින් වැඩි ප්‍රමාණයක් නීතිමය ක්‍රියාමාර්ග හා සම්බන්ධ බැවින් එම සංරචකය යටතේ දක්වා ඇත.**

**2 වගුව: 2023 මැයි: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 03**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| පහරදීම් | 01 |
| බාධා කිරීම් | 01 |
| මානසික බලපෑම් | 01 |
| **එකතුව** | **03** |

01. **ගෝල්ෆේස් අරගලකරුවන්ට පහරදීමේ සිද්ධියට වසරක් පිරීම සැමරීමට ගිය සිවිල් ක්‍රියාකාරිකයින් පිරිසක් පොලිසිය විසින් පලවා හරිනු ලැබීම.**

    මෙම පිරිස ගෝල්ෆේස් පිටිය අසල විරෝධතාව පැවැත්වීමට සූදානම් වූ අවස්ථාවේ, එහි විරෝධතා පැවැත්වීමට නොහැකි බවට ගැසට් නිවේදනයක් හා අධිකරණ නියෝගයක් ඇතැයි සඳහන් කළ පොලිසිය, පිරිස එතැනින් ඉවත් කර ඇත. ඔවුන් නැවත පිටකොටුව දුම්රිය ස්ථානය ඉදිරිපිට රැස් වූ විට එතැනින්ද පලවා හැර තිබේ. පසුව කොළඹ මහජන පුස්තකාලය අසලදී ඔවුහු සිය අත්දැකීම මාධ්‍යයට විස්තර කළහ.

    මූලාශ්‍රය: youtube.com

02. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන ප්‍රියත් නිකේෂලට දේශපාලනඥයකු ඇතුළු කණ්ඩායමක් පහර දීම.**

    ප්‍රියත් නිකේෂල මැයි 10 වැනිදා සිය මෝටර් රථයෙන් ගමන් ගනිමින් සිටියදී කඩුවෙල හිටපු උප නගරාධිපති චන්ද්‍රික අබේරත්න ඇතුළු පිරිසක් බත්තරමුල්ල කොස්වත්ත ප්‍රදේශයේදී රථය නතර කොට එහි වීදුරු බිඳ මෙම ප්‍රහාරය එල්ල කර තිබේ. තුවාල ලැබූ ප්‍රියත් නිකේෂල කොළඹ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී, ප්‍රහාරය සිදු කළ තැනැත්තාගේ පැමිණිල්ලක් මත පොලිසිය විසින් අත්අඩංගුවට ගැනිණි. රෝහලට පැමිණ ඔහු පරීක්ෂා කර බැලූ මාලිගාකන්ද වැඩ බලන මහේස්ත්‍රාත්වරයා, රු. ලක්ෂ 25 බැගින් වූ ශරීර ඇප දෙකක් මත ඔහු නිදහස් කිරීමට නියෝග කළේය. චූදිත හිටපු නගරාධිපතිවරයාද පොලිසිය විසින් අත්අඩංගුවට ගැනුණු අතර අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඇප මත මුදාහැරිණි.

    මූලාශ්‍ර: youtube.com, ravanalankanews.lk

03. **අරුණ පුවත්පතේ මාධ්‍යවේදියකු පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව හමුවට කැඳවන්නැයි, ඇමති කංචන විජේසේකර කථානායකවරයාගෙන් ඉල්ලා සිටීම.**

    මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශයකින් හා එම ප්‍රකාශය අරුණ පුවත්පතෙහි හා එම වෙබ් අඩවියෙහි පළ කිරීමෙන් තම වරප්‍රසාද කඩ වී ඇති බව සඳහන් කරමින් ඇමතිවරයා අදාළ ඉල්ලීම කර තිබේ. පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි විසින් මැයි 24 වැනිදා කරන ලද එම ප්‍රකාශය මාධ්‍යවේදී නිලන්ත මධුරාවල අරුණ පුවත්පතට හා එම වෙබ් අඩවියට වාර්තා කර තිබිණි.

    මූලාශ්‍ර: truenews.lk, youtube.com

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 11ක් මැයි මාසය තුළ නිරීක්ෂණය විය. පොලිසිය භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට බාධා කිරීම් හා අවහිර කිරීම්වලින් ඔබ්බට ගොස් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ අවස්ථා වර්ධනය වී ඇති බව කැපී පෙනෙන කරුණකි.**

**3 වගුව: 2023 මැයි : නීතිමය කොන්දේසි - සිදුවීම් 11**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 11 |
| **එකතුව** | **11** |

01. **දේශපාලන මතයක් දැරීම නිසා අසාදු ලේඛනගත කිරීමට එරෙහිව විශ්‍රාමික හමුදා නිලධාරියකු මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.**

ජාතික ජන බලවේගයට සහාය පළ කරමින් අදහස් ප්‍රකාශ කිරීම හේතුවෙන්, තමන් අසාදු ලේඛනගත කිරීමට ගුවන් හමුදාපතිවරයා ගෙන ඇති තීරණය බල රහිත කරන ලෙස, ගුවන් හමුදාවේ විශ්‍රාමික එයාර් වයිස් මාෂල් සම්පත් සංජීව තුයිකොන්තා විසින් මැයි 02 වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම ගොනු කරන ලදි.

පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස ගුවන් හමුදපතිවරයා, එහි ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරයා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා සහ නීතිපතිවරයා නම් කරනු ලැබ සිටිති.

මූලාශ්‍රය: bbc.com

02. **මාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන්ට එරෙහි නඩුව: පැමිණිලිකාර හමුදා බුද්ධි අංශ නිලධාරියාට නොතීසි නිකුත් කිරීම.**

2019 අප්‍රේල් මාසයේදී, අතුරුදන් වූවන්ගේ ඥාතීන් පැවැත්වූ විරෝධතා පා ගමනක් වාර්තාකිරීමෙහි නිරතව සිටි මාධ්‍යවේදීන්ට තර්ජනය කොට ජංගම දුරකථනයකින් ඔවුන් රූ ගත කළ සැකකටයුතු පුද්ගලයකුගෙන් ප්‍රශ්න කිරීමේ සිද්ධියක් මෙම නඩුවට පදනම්ව තිබේ. පසුව මෙම පුද්ගලයා නාවික හමුදා බුද්ධි අංශ නිලධාරියකු බව හෙළි වූ අතර, ඔහු විසින් තවසීලන්ට එරෙහිව කරන ලද පැමිණිල්ලක් මත මෙම නඩුව පවරා තිබිණි. මැයි 04 වැනිදා මෙම නඩුව කැඳවන ලද අවස්ථාවේදී පැමිණිලිකාර නාවික හමුදා නිලධාරියා පැමිණ නොසිටි අතර ඔහු ඊළඟ නඩු වාරය වන සැප්තැම්බර් 21 වැනිදා අධිකරණයට කැඳවීමට මුලතිව් මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

මූලාශ්‍රය: theleader.lk/news

03. **පොලිසියට තොරතුරක් ලබා දුන් පුද්ගලයකු ICCPR පනත යටතේ සැකකරුවකු කිරීම, අධිකරණයේ දෝෂදර්ශනයට ලක් වීම.**

අකුරන ප්‍රදේශයේ මුස්ලිම් ආගමික ස්ථානවලට ප්‍රහාරයක් එල්ල විය හැකි බවට ලැබුණු තොරතුරක් පොලිසිය වෙත දැනුම් දුන් ඉසදීන් මොහොමඩ් සජිත් නැමති 21 හැවිරිදි තරුණයකු අප්‍රේල් 24 වැනිදා පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාර ගත කර තිබිණි. දින 16ක් තිස්සේ රක්ෂිත බන්ධනාගාරගත කර සිටි එම සැකකරු සම්බන්ධ නඩුව මැයි 4 වැනිදා යළි කැඳවූ අවස්ථාවේ, විත්තියේ නීතිඥවරුන් ඉදිරිපත් කළ කරුණු සැලකිල්ලට ගත් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා, ICCPR පනත යටතේ නගා තිබූ චෝදනාවෙන් ඔහු නිදහස් කොට, සෙසු චෝදනා සම්බන්ධයෙන් ඇප නියම කළේය.

මූලාශ්‍ර: thetime.lk, mawbima.lk

04. **ගෝල්ෆේස් ප්‍රහාරය සම්බන්ධයෙන් යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා තනිව පාගමනක නිරත වූ සමාජ ක්‍රියාකාරිනියක අත්අඩංගුවට ගැනීම.**

ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිනියක වූ මොරින් නූර්, මැයි 9 වැනිදා දෙමටගොඩ සිට පිටකොටුව දක්වා පාගමනින් පැමිණෙන අතරතුර, මාලිගාවත්ත පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදි. 10 වැනිදා කොළඹ කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු. ලක්ෂයක ශරීර ඇප මත මුදා හැරිණි.

මූලාශ්‍ර: youtube.com, youtube.com

05. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරික දර්ශන හඳුන්ගොඩට එරෙහිව අධිකරණයෙන් පනවා තිබූ වාරණ නියෝගයක් දීර්ඝ කිරීම.**

'එක්ස්ප්‍රස් පර්ල්' වන්දි නඩුව සම්බන්ධයෙන් අසත්‍ය කරුණු සහ නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකුට හා රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරියකට අපහාසාත්මක වන ආකාරයේ කරුණු යූටියුබ් නාලිකාව ඔස්සේ පළ කිරීම වළක්වමින් කොළඹ දිසා අධිකරණය මගින් මැයි මස 10 වැනිදා දක්වා බල පැවැත්වෙන පරිදි මෙම වාරණ නියෝගය පනවා තිබිණි. එම නියෝගය ජූනි 24 වැනිදා දක්වා දීර්ඝ කිරීමට කොළඹ දිසා විනිසුරු පූර්ණිමා පරණගම නියෝග කළාය.

මූලාශ්‍රය: theleader.lk

06. **වීසා අවලංගු කිරීමෙන් මූලික අයිතිවාසිකම් කඩ වූ බවට බ්‍රිතාන්‍ය ජාතික තරුණියක ඉදිරිපත් කළ පෙත්සම ප්‍රතික්ෂේප කිරීම.**

ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටිමින් ගෝල්ෆේස් අරගලයට සහාය පළ කළ කිලී ෆ්‍රේසර්ගේ වීසා අවලංගු කිරීමට ආගමන විගමන පාලකවරයා ගත් තීරණයට එරෙහිව මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම ඉදිරිපත් කර තිබිණි. එය විභාගයට නොගෙනම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කළ ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල, රු. ලක්ෂ 5ක නඩු ගාස්තුවක් ගෙවිය යුතු බවටද ඇයට නියම කළේය.

මූලාශ්‍රය: theleader.lk

07. **උතුරේ බෞද්ධ විහාරස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට එරෙහිව උද්ඝෝෂණයක නිරත වූ 9 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

කන්කසන්තුරේ වලිකාමම් උතුරේ තයියිට්ටි ප්‍රදේශයේ බෞද්ධ විහාරස්ථානයක් ඉදිකිරීම සඳහා සිය ඉඩම් යුද හමුදාව විසින් අත්පත් කර ගෙන ඇති බවට චෝදනා කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රී සෙල්වරාජා ගජේන්ද්‍රන්ගේ නායකත්වය යටතේ විරෝධතාවක නිරතව සිටි දෙමළ ජාතිකයන් 9 දෙනෙකු 23 වැනිදා පලාලි පොලීසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදි.

මූලාශ්‍රය: tamilguardian.com

08. **ප්‍රහසනාත්මක ඉදිරිපත්කිරීමකදී ආගමික අපහාසයක් සිදු කළේය යන චෝදනාව මත, ප්‍රහසන කලා ශිල්පිනී නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීම.**

කොළඹදී පැවැති ප්‍රහසන කලා ප්‍රසංගයකදී කළ ඉදිරිපත් කිරීමක් සම්බන්ධයෙන් බෞද්ධ භික්ෂූන් ඇතුළු පිරිසක් විසින් කරන ලද පැමිණිලි මත, මැයි 28 වැනිදා කටුනායක ගුවන්තොටුපළේදී ඇය අත්අඩංගුවට ගැනුණු අතර, කොටුව මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ජූනි 07 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනතේ (ICCPR) 3 වන වගන්තිය සහ දණ්ඩ නීති සංග්‍රහයේ 91(අ) වගන්ති ප්‍රකාරව ඇයට එරෙහිව චෝදනා ගොනු කර තිබේ.

මූලාශ්‍රය: thetime.lk

09. **නතාෂා එදිරිසූරියගේ ප්‍රහසනාත්මක ඉදිරිපත් කිරීම, යූ ටියුබ් ඔස්සේ ප්‍රචාරය කිරීමේ චෝදනාව මත යූටියුබ් නාලිකා ප්‍රධානියකු අත්අඩංගුවට ගැනීම.**

ආගමික අපහාසයක් අන්තර්ගත බවට චෝදනා එල්ල වී ඇති, නතාෂා එදිරිසූරියගේ ප්‍රහසනාත්මක ඉදිරිපත් කිරීම යූ ටියුබ් නාලිකාවක පළ කිරීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වූ බෲනෝ දිවාකර මැයි 31 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගැනිණි. ජූනි 01 වැනිදා කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ජූනි 07 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කෙරිණි.

මූලාශ්‍ර: lankadeepa.lk, liveat8.lk

10. **වෛද්‍ය චමල් සංජීවගේ මූලික අයිතිවාසිකම් පෙත්සම, ශ්‍රේෂ්ඨාධිකරණය නිශ්ප්‍රභ කිරීම.**

සූරියවැව දරුවන්ගේ මන්දපෝෂණය පිළිබඳව ජනමාධ්‍යයට කළ ප්‍රකාශයක් හේතුවෙන් සිය වැඩ තහනම් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය ගත් තීරණයට එරෙහිව වෛද්‍ය චමල් සංජීව මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම ගොනු කර තිබිණි. මෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණයේ නිගමනය වූයේ ආයතන ප්‍රධානීන්ගේ අනුමැතියකින් තොරව ජනමාධ්‍ය වෙත තොරතුරු ප්‍රකාශ කිරීමට රාජ්‍ය නිලධාරීන්ට නීතිමය හැකියාවක් නොමැති බවයි. බුවනෙක අලුවිහාරේ සහ ප්‍රීති පද්මන් සූරසේන යන විනිසුරුවරුන්ගේ එකඟත්වය සහිතව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ප්‍රියන්ත ප්‍රනාන්දු විසින් තීන්දුව ප්‍රකාශයට පත් කෙරිණි.

මූලාශ්‍ර: ft.lk, supremecourt.lk

11. **ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් නඩු දෙකකට අදාළව සැකකරුවකු ලෙස නම් කිරීම වළක්වන ලෙස ඉල්ලා ගොනු කර ඇති අභියාචනයේ තීන්දුවට දින නියම කිරීම.**

ගෝල්ෆේස් අරගලකරුවන්ට පහරදීම සම්බන්ධයෙන් ඔහු සැකකරුවකු ලෙස නම් කරන ලෙස නීතිපතිවරයා නිකුත් කර ඇති ලිපියක් හා ජනාධිපති මන්දිරයේ තිබී හමු වූ මුදල් සම්බන්ධ නඩුවේ සැකකරුවකු ලෙස අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් නිකුත් කර තිබූ සිතාසියක් බල රහිත කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා, දේශබන්දු තෙන්නකෝන් විසින් අභියාචනාධිකරණය හමුවේ මෙම පෙත්සම් ගොනු කර තිබිණි. අදාළ තීන්දුව, ජූනි 23 වැනිදා ප්‍රකාශයට පත් කරන බව අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න සහ ඒ. මරික්කාර් යන අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල විසින් මැයි 30 වැනිදා නිවේදනය කෙරිණි.

මූලාශ්‍රය: adaderana.lk

## වෘත්තියවේදීත්වය

**වෘත්තියවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධීනත්වය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිග ැනීම යන දර්ශක ඇතුළත් වේ. මෙම සංරචකය යටතට ගැනෙන සිදුවීමක් අපේල් මාසයේදී නිරීක්ෂණය විය.**

**4 වගුව: 2023 මැයි: වෘත්තියවේදීත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය | 01 |
| **එකතුව** | **01** |

01. **තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් කොළඹදී එළිදැක්වීම.**

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය විසින් සම්පාදනය කෙරුණු මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය, මැයි 23 වැනිදා බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ පැවති සමුළුවකදී එළිදැක්විණි. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් සහ වෘත්තිකයින් රැසක් මෙම අවස්ථාවට එක් ව සිටි අතර තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය කනක හේරත් ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි විය. සයිබර් ආරක්ෂක පනතක් මේ වසර තුළදී ගෙන බව ඇමතිවරයා එහිදී ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: theleader.lk

---

## වියුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම සංරචකයට ඇතුළත්ය. මේ අතුරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන සිදුවීම් 06ක් සහ මහජන සේවා විකාශන ආකෘතිවල පැවැත්ම යන දර්ශකයට අයත් සිදුවීම් 02ක් මෙහි ඇතුළත් වේ. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසද ඇතුළුව මූලික අයිතිවාසිකම් බරපතළ ලෙස අභියෝගයට ලක් කෙරෙන, යෝජිත ත්‍රස්ත විරෝධී පනත සම්බන්ධයෙන් පාර්ශ්ව කිහිපයක ප්‍රතිචාරද ඊට අයත් ය.**

**5 වගුව: 2023 මැයි: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 08**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 06 |
| මහජන සේවා විකාශන ආකෘතිවල පැවැත්ම | 02 |
| **එකතුව** | **08** |

01. **රජය විසින් කෙටුම්පත් කර ඇති නව ත්‍රස්ත විරෝධී පනත පිළිබඳව එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවන් 10 දෙනෙකු ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාට ලිපියක් යොමු කිරීම.**

යෝජිත පනත මගින් පුරවැසියන්ගේ මානව හිමිකම් හා මූලික නිදහස කෙරෙහි ඇති විය හැකි බලපෑම් පිළිබඳව සඳහන් මෙම ලිපිය, ත්‍රස්තවාදයට එරෙහි නීති සම්පාදනයේදී ජාත්‍යන්තර මානව හිමිකම් නීති හා බැඳීම්වලට අනුකූල විය බවද අවධාරණය කරයි. එහිදී සැලකිල්ලට ගත යුතු ප්‍රධාන කරුණු 5ක් එම ලිපිය මගින් පෙන්වා දී තිබේ.

මූලාශ්‍රය: newsfirst.lk

02. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා යෝජිත ත්‍රස්ත විරෝධී පනතෙන් (ATA) භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ඇති කරන බලපෑම පිළිබඳ සම්මන්ත්‍රණයක් කොළඹදී පැවැත්වීම.**

මැයි 3 වැනිදාට යෙදී තිබූ 'ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය' නිමිත්තෙන්, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සංවිධානය කළ මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පරාක්‍රම විසින් සිදු කෙරිණි. නීතිඥ නුවන් බෝපගේ සහ මාධ්‍යවේදී සරෝජ් පතිරණ සහභාගී වූ සංවාද මණ්ඩපයක්ද මියන්මාරයේ මානව හිමිකම් ක්‍රියාකාරිනී සූ මොන්ග් අන්ග්, මියන්මාරයේ සහ ලංකාවේ මාධ්‍ය නිදහස පිළිබඳව කළ අදහස් දැක්වීමක්ද වැඩසටහනට ඇතුළත් විය.

මූලාශ්‍රය: MFRM Desk, sinhala.ejournalist.lk

03. **ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය නිමිත්තෙන් 'ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් හා සිවිවන කුලුනේ භූමිකාව' මැයෙන් මාර්ගගත සම්මන්ත්‍රණයක් පැවැත්වීම.**

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය එක්ව සංවිධානය කළ මෙම සම්මන්ත්‍රණය මැයි 6 වැනිදා පැවැත්විණි. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන පරාක්‍රම, අනිද්දා පුවත්පතේ කර්තෘ කේ.ඩබ්ලිව්. ජනරංජන, පර්යේෂිකා ට්‍රායි කැලී බල්තසාර් සම්පත්දායකයින් ලෙස සහභාගී වූ අතර වැඩසටහන මෙහෙයවන ලද්දේ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැඳවුම්කරු ලසන්ත ද සිල්වා විසිනි.

මූලාශ්‍රය: MFRM Desk

04. **මාධ්‍ය මර්දනයට හා යෝජිත ප්‍රතිත්‍රස්ත පනතට විරෝධය පළ කරමින් උතුරේ ජනමාධ්‍යවේදීන් මාධ්‍ය නිදහස් දිනය සැමරීම.**

මැයි 3 වැනිදා යාපනය මාධ්‍ය සමාජය ඉදිරිපිට මෙම උද්ඝෝෂණය සංවිධානය කර තිබූ අතර, දිගින් දිගටම සිදු වන මාධ්‍ය මර්දනය, මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සම්බන්ධයෙන් යුක්තිය ඉටු නොකිරීම හා යෝජිත ප්‍රතිත්‍රස්ත පනතට එරෙහිව මාධ්‍යවේදීහු අදහස් පළ කළහ.

මූලාශ්‍රය: [theleader.lk](theleader.lk)

05. **රජය මගින් කෙටුම්පත් කර ඇති ත්‍රස්ත විරෝධී පනත මගින් ජනමාධ්‍ය නිදහසට හා ජනමාධ්‍යවේදීන්ට එල්ල වන බලපෑම පිළිබඳ සංවාදයක් හෑෂ්ටැග් පරපුර විසින් පැවැත්වීම.**

මැයි 10 වැනි බදාදා සූම් ඔස්සේ පැවැත්වූ මෙම සංවාදයෙහි ආරාධිත කථිකයින් ලෙස, නීතිඥ හිජාස් හිස්බුල්ලා, නීතිඥ ස්වස්තිකා අරුලිංගම්, මානව හිමිකම් ක්‍රියාකාරිනී ශ්‍රීන් සරූර්, සමාජ මාධ්‍ය ක්‍රියාකාරික බෙනිස්ලස් තුශාන් යන අය සහභාගී වූ අතර හෑෂ්ටැග් පරපුරේ ෆාරා ෆිර්දවුස් සංවාදය මෙහෙයවීය. සංවාදය දෙමළ බසින් පැවැත්විණි.

06. **ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා වසා දැමීමට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව තීරණය කිරීම.**

මැයි මස 31 වැනිදායින් පසු ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රාදේශීය සේවා වසා දැමීමට එහි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කොට ඇත. ඒ අනුව, රුහුණ, රජරට සහ කඳුරට යන ප්‍රාදේශීය ගුවන් විදුලි සේවා සිංහල ස්වදේශීය සේවය සමඟත් යාපනය ප්‍රාදේශීය ගුවන් විදුලි සේවය සහ එෆ් එම් සේවය දෙමළ ස්වදේශීය සේවය සමඟ ඒකාබද්ධව කරන ලෙස 2023-05-19 දිනැති අදාළ චක්‍රලේඛය මගින් දැනුම් දී තිබේ.

මූලාශ්‍රය: [divaina.lk](divaina.lk)

07. **ගුවන්විදුලි සංස්ථාවේ සේවකයින් සඳහා, ස්වේච්ඡාවෙන් සේවයෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දීම.**

පාඩු ලබන රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ යටතේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සේවක සංඛ්‍යාව සියයට 50කින් අඩු කිරීමට යෝජනා වී ඇති අතර, ඒ සඳහා හඳුන්වා දී ඇති ස්වේච්ඡා වන්දි ක්‍රමය සඳහා අප්‍රේල් 04 වැනිදා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිව තිබේ. මේ යටතේ සේවකයින් 300 දෙනෙකු සේවයෙන් ඉවත් වීමට කැමැත්ත පළ කර ඇතැයි අනාවරණය වේ.

මූලාශ්‍ර: [colombotimes.lk](colombotimes.lk), [deshaya.lk](deshaya.lk), [facebook.com](facebook.com)

08. **ප්‍රහසන කලා ශිල්පිනී නතාෂා එදිරිසූරියට එරෙහිව ICCPR පනත යටතේ චෝදනා ගොනු කිරීමට විරෝධය පළ කරමින් කලා ක්ෂේත්‍රයේ පිරිසක් ප්‍රවෘත්ති සාකච්ඡාවක් පැවැත්වීම.**

ICCPR පනත යටතේ චෝදනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් දී තිබෙන මාර්ගෝපදේශ නොතකමින්, නතාෂාට එරෙහිව එම පනත යටතේ චෝදනා ගොනු කිරීම මෙම ප්‍රවෘත්ති සාකච්ඡාවේදී විවේචනයට ලක් විය. මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් අදහස් ප්‍රකාශනයේ නිදහස අභියෝගයට ලක් වන බව එහිදී අවධාරණය කෙරිණි.

මූලාශ්‍ර: [facebook.com](facebook.com)

**6 වගුව: මාධ්‍ය නිදහස: 2023 ජනවාරි-මැයි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2023 ජනවාරි - අප්‍රේල් | | 2023 මැයි |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 18 | - | 03 |
| නීතිමය කොන්දේසි | 31 | 03 | 11 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | - | - | - |
| වෘත්තීයවේදීත්වය | 02 | - | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 11 | - | 08 |
| **එකතුව** | **62** | **03** | **23** |

පසුගිය මාධ්‍ය නිදහස මාසික වාර්තා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු  සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම  මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener: Lasantha De Silva  +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer:  Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05.  Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25


Layout: Nalinda Seneviratne